දිවි අහිමි කරගැනීම් යනු සැබෑ සමාජ ගැටළුවක් බවට පත්ව තිබීම නිසා, ඒ සම්බන්ධයෙන් මාධ්‍ය මගින් වාර්තා කිරීමේ කිසිදු ගැටළුවක් නොමැත. එනමුත්, එම වාර්තා කිරීම ඔස්සේ චක්‍රාකාරී දිවි අහිමි කරගැනීම් සිදු නොවීමට සහ අදාළ වෙනත් පාර්ශවයකට සිත් වේදනා ඇති නොවීම සඳහා, මනා ප්‍රවේසම් සහගත සහ ආචාර ධර්මානුකූල ආකාරයකින් දිවි අහිමි කරගැනීම් වාර්තා කළ යුතු වේ.

විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් සමාජයේ විශේෂ අවධානය යොමුව ඇති මෙම මොහොතේදී, ඊට අදාළ වන මෙවැනි දිවි අහිමි කරගැනීම් සඳහාද විශේෂයෙන් අවධානයක් ලැබෙනා බැවින්, දිවි අහිමි කරගැනීම්ද වසංගතයක් ලෙසින් පැතිර යෑම වැළැක්වීම උදෙසා මාධ්‍ය මගින් වගකීම් සහගත හා ආචාර ධාර්මික ප්‍රවේශයකින් එම සිදුවීම් ආවරණය කිරීම අනිවාර්ය වේ.

දිවි අහිමි කරගත් පුවතට අනවශ්‍ය ප්‍රමුඛතාවයක් ලබා නොදෙන ලෙසින් සහ දිවි අහිමි කරගත් ආකාරය පළ නොකරන ලෙසින් මාධ්‍ය දිරිමත් කරන්නේ, ඒ ඔස්සේ තවත් අයෙකු දිවි අහිමි කරගැනීමට පෙළඹීම, අනුකාරක දිවි අහිමි කරගැනීම් සිදුවීම වළක්වාලීම සඳහායි. එසේම දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීමේදී උපකාරක අංක සඳහන් කරන මෙන් පැවසෙන්නේ, ඒ ඔස්සේ දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට අවස්ථාවක් සැලසිය හැකි බැවිනි.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina #SundayLankadeepa